සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

9246

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2023 (2024)
க.பொ.த. (சா/த) முன்மாதிரிப் பரீட்சை 2023 (2024)
G.C.E. (O/L) Practice Test - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | බුද්ධ ධර්මය | 33 S II |
| කාලය / நேரம் / Time | පැය 3 යි | | |

- මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ . ඉතිරි ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

## II කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

(i) අංගුලිමාල දමනයෙන් ප්‍රකට වන බුද්ධ ගුණය ලියා දක්වන්න.

(ii) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා දෙක නම් කරන්න.

(iii) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(iv) බුදු දහමේ ඉගැන්වෙන අනණ සුඛය යන්න කෙටියෙන් හඳුන්වන්න.

(v) සාමඤ්ඤඵල සූත්‍රයේ කාමච්ඡන්ද නීවරණය හා ව්‍යාපාද නීවරණය උපමා කර ඇත්තේ කෙසේද?

(vi) බුද්ධ ප්‍රතිමා ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දක්වනු ලැබේ. ඉන් දෙකක් ලියන්න.

(vii) රේරුකානේ චන්ද්විමල නාහිමියන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(viii) කුරුණෑගල සාහිත්‍ය යුගයට අයත් බෞද්ධ සාහිත්‍ය කෘති දෙකක් ලියන්න.

(ix) "වේරමණී සික්ඛාපදං සමාදියාමි" මෙම පාඨයේ තේරුම ලියන්න.

(x) එංගලන්තයේ පාලි පොත් සමාගම (Pali text Society) ආරම්භ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ල. 2×10 = 20)

02. (i) දස පාරමිතා අතුරින් 2 ක් නම් කරන්න.

(ii) ඉහත (1) හි නම් කළ එක් පාරමිතාවක් කෙටියෙන් හඳුන්වන්න.

(iii) යහපත් දැහැමි සමාජයක් ගොඩනැගීමට පාරමිතාවල ඇතුළත් ගුණධර්ම ඉවහල් වන අයුරු විස්තර කරන්න.

(2+3+5=10)

03. (i) "නංච කම්මං කතං සාධු" යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ සරල අදහස ලියා දක්වන්න.

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්ම පදයෙන් ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න.

(2+3+5=10)

04. (i) දසරාජ ධර්මවලට අයත් කරුණු අතුරෙන් දෙකක් ලියන්න.

(ii) ඉහත (1) හි දැක්වූ කරුණුවලින් එක් කරුණක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(iii) යහපත් රාජ්‍ය පාලනයක් සඳහා දසරාජධර්ම ඉවහල් වන අයුරු විස්තර කරන්න.

(2+3+5=10)



EXAMRESULTS.LK

05. (i) තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට ඉවහල් වූ කරුණු කෙටියෙන් පහදන්න.

(ii) එම ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය, රාජානුග්‍රහය ලබාදුන් පාලකයා හා මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ නම් කරන්න.

(iii) "බුදු දහමෙහි දේශාන්තර ව්‍යාප්තිය සිදු වූයේ තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසය." පැහැදිලි කරන්න. (2+3+5=10)

06. (i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වෙන පුද්ගලයාගේ මෙලොව හිතසුව පිණිස පවතින කරුණු දෙකක් ලියන්න.

(ii) ඉහත (i) හි දක්වූ කරුණුවලින් එක් කරුණක් කෙටියෙන් හඳුන්වන්න.

(iii) එම කරුණු මෙලොව ජීවිතය සාර්ථක කරගැනීම සඳහා හේතු වන අයුරු පැහැදිලි කරන්න. (2+3+5=10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු රජතුමා.

(ii) බෞද්ධ ස්තූප

(iii) දුක්ඛ සමුදය සත්‍යය.

(iv) පන්සිය පනස් ජාතකය. (ල. 5+5=10)